

# ඔබට අය වැයෙන්

2022



# ඔබට
# අය වැයෙන්

2 0 2 2

ගරු මුදල් අමාත්‍ය
බැසිල් රාජපක්ෂ මැතිතුමන් විසින්
2021 නොවැම්බර් 12 වන දින
ඉදිරිපත් කරන ලද
2022 රාජ්‍ය අයවැයෙන් හිමිවන
මහජන ප්‍රතිලාභ පිළිබඳ
සංක්ෂිප්ත වාර්තාවකි.

ඔබට අය වැයෙන්

# වසවිසෙන් තොර අලුත් ආහාර සංස්කෘතියක්

කාබනික ආර්ථිකයක් සඳහා වූ වැඩසටහන යටතේ මෙතෙක් පැවති රසායනික පොහොර සහනාධාරය වෙනුවට, 2021/22 මහ කන්නයේ සිට සෑම ගොවියෙකුටම තම ගොවිතැන සඳහා අවශ්‍ය කරන දේශීය ඝන හා දියර කාබනික පොහොර නිෂ්පාදනය කර ගැනීමටත්, රසායනික කෘමිනාශක වෙනුවට කාබනික කෘමිනාශක නිෂ්පාදනයටත් අවශ්‍ය ආරම්භක කාරක ප්‍රාග්ධනය (Start-up working capital) සැපයීම සඳහාත් ගොවීන්ට සහනාධාර සැපයීම සඳහාත් දැනටමත් රුපියල් මිලියන 35,000ක් වෙන් කර තිබෙනවා. අපේ ඉලක්කය වසවිසෙන් තොර ආහාර සංස්කෘතියක් සමග ජාතියේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමයි.



ඔබට අය වැයෙන්

# ගොවීන්ට තවත් විශේෂ සහනාධාරයක්

අධික විෂ රසායනික භාවිතයෙන් බැහැර වූ විකල්ප වල් නාශක ක්‍රමවේදයන් භාවිත කිරීම වැනි යහපත් නිෂ්පාදන පිළිවෙත් අනුගමනය කිරීම ඉතාම වැදගත් පියවරක්. එබැවින් වල්පැළහරණය සඳහා වූ විකල්ප දිරිගැන්වීම වෙනුවෙන් රුපියල් මිලියන 4,000 ක් වෙන් කිරීමට යෝජනා කරනවා. ඒ අනුව වල්පැළහරණය සහ වල්පැළෑටි අවම වන පරිදි වගා බිම් සකස් කර ගැනීම සඳහා (හෙක්ටයාර 2 ක උපරිමයකට යටත්ව) හෙක්ටයාරයට රුපියල් 5,000 බැගින් ආධාර මුදලක් ලබා දීමට යෝජනා කරනවා.



ඔබට අය වැයෙන්

# කෘෂි තාක්ෂණ විප්ලවයක්

ලෝකයේ කෘෂිකාර්මික අංශයෙන් දියුණු රටවල් හා සසඳන විට අපි කෘෂිකාර්මික අංශය නවීකරණය කඩිනම්ව සිදු කළ යුතු වෙනවා. නව කෘෂි තාක්ෂණය හඳුන්වා දීම සඳහා මේ වන විටත් විසර්ජන පනතින් වෙන් කළ රුපියල් මිලියන 17,005 මුදලට අමතරව තවත් රුපියල් මිලියන 5,000 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.



# සැමට පානීය ජලය

පැය 24 පුරා ම පිරිසිදු අඛණ්ඩ ජල සැපයුමක් සහතික කිරීම සඳහා සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ආරම්භ කරන ලද සැමට ජලය වැඩසටහන මල්ඵල ගැන්වීම උදෙසා ආරම්භ කර ඇති ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රම කඩිනම් කිරීම සඳහා 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර ඇති රුපියල් මිලියන 33,963 ප්‍රතිපාදනයන්ට අමතරව, තවත් රුපියල් මිලියන 15,000 ක ප්‍රතිපාදනයන් වෙන් කිරීමට මා යෝජනා කරනවා. ඒ අනුව, පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමේ 90% ඉලක්කයට, අපි 2024 දෙසැම්බර් 31 වන විට ළඟා වෙනවා.



# ධීවර සහ ජලජීවී ක්ෂේත්‍රයට විශේෂ සහන

අපේ විසිතුරු මත්ස්‍යයින්ට යුරෝපයේ හා ඇමරිකාවේ විශාල ඉල්ලුමක් පවතින බවත් සතුටින් ප්‍රකාශ කිරීමට කැමතියි. පසුගිය වසංගත සමයේත් එම අපනයන කටයුතු සඳහා අවශ්‍ය සියලු පහසුකම් රජය විසින් සපයනු ලැබුවා. සකස් කළ මාළු, කරවල, උම්බලකඩ, ටින් මාළු නිෂ්පාදන දිරි ගැන්වීමට අවශ්‍ය පහසුකම් තවදුරටත් පුළුල් කරනු ලබනවා.

- ලබන 2022 වසරේ දී, හෙක්ටයාර් ලක්ෂ දෙකක (200,000) පමණ වපසරියෙන් යුත් මිරිදිය ජලාශවලට, මත්ස්‍ය පැටවුන් මිලියන 196 ක් මුදා හැර, රුපියල් මිලියන 18,000ක් පමණ වටිනාකමකින් යුතු, මෙට්‍රික් ටොන් 125,000 ක පමණ අස්වැන්නක් ලබා ගැනීමට බලාපොරොත්තු වෙනවා.
- ධීවර නැංගුරම් පොළවල්, ධීවර වරායන් වැඩි දියුණු කිරීම හා ඉදිකිරීම සඳහා වන වැඩසටහන් ගණනාවක් දැනටමත් ක්‍රියාත්මකවෙමින් පවතිනවා.

එම කාර්යයන් සඳහා මේ වන විට, විසර්ජන පනතින් වෙන් කර ඇති මුදලට අතිරේක වශයෙන් තවත් රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා.





# වැවිලි ආර්ථිකයටත් සහන රැසක්

වැවිලි කර්මාන්තයෙන් උපරිම ඵල නෙළාගැනීමට දැනට වගා කර ඇති තේ, පොල්, රබර්, කුරුඳු, ගම්මිරිස්, කෝපි, පැඟිරි, වැනිලා, එනසාල්, කරාබුනැටි ඇතුළු අනෙකුත් අපනයන බෝග වගාවන්වල සිදු වී ඇති පසුබෑම හඳුනාගත යුතු වෙනවා.

ඒ අනුව බෝග නැවත සිටුවීම, පාළු සිටුවීම, නව වගාව සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු වෙනවා. ජල සම්පාදනය තහවුරු කිරීම මගින් එම බෝග වගාවල නිෂ්පාදන ඵලදායිතාවය ඉහළ නැංවීමට හැකියි. තවද, පෞද්ගලික ආයෝජන දිරිමත් කිරීමටත්, අපනයන වෙළඳපොල උපක්‍රමශීලීව ජයගැනීමටත් අපේක්ෂා කරනවා.

ඒ වෙනුවෙන් විසර්ජන පනතෙන් වෙන් කළ මුදලට අමතරව තවත් රුපියල් මිලියන 10,000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# පාරම්පරික නිෂ්පාදන කර්මාන්තවලටත් දැවැන්ත සහනයක්

නූතන තාක්ෂණය හා ගුණාත්මකභාවය නිෂ්පාදන තුළට එකතු කිරීම අවශ්‍යයි. තම නිෂ්පාදනවලට ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොළට ප්‍රවිෂ්ඨ වීම සඳහා ඇති බාධා ඉවත් කර දීම අපේ වගකීමයි.

එහෙයින්, දේශීය පාරම්පරික ගෘහ කර්මාන්ත ආරක්ෂා කර සංවර්ධනය කිරීම වෙනුවෙන් වූ අමාත්‍යාංශයක් වෙත අපි වගකීම පවරා තිබෙනවා. ඒ අනුව, වේවැල්, මැටි, පිත්තල, ලාක්ෂා, වෙස් මුහුණු, පොල්කටු, ස්වර්ණාභරණ, ගල් කැටයම්, හණ හා දුම්බර රටා වැනි පාරම්පරික ගෘහ කර්මාන්ත දියුණු කිරීම සඳහා දැනට වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 1,000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# පශු සම්පත් සංවර්ධනයට තවත් මිලියන 1,000 ක්

දීර්ඝ කාලයක් තිස්සේ මහජනතාවගේ ප්‍රෝටීන් අවශ්‍යතාවය සපුරාලීම සඳහා රජය විවිධ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කළා. ඒවායේ ප්‍රතිඵල ලෙස බිත්තර සහ කුකුල් මස් නිෂ්පාදනය අපි විශාල ලෙස ඉහළ නංවා ගනු ලැබුවා. 2021 වසරේ දී කුකුල් මස් අපනයනය කිරීමට ද අපට හැකි වුණා.

එහෙත්, කිරි නිෂ්පාදනය සම්බන්ධයෙන් තවදුරටත් අප වෙහෙසිය යුතු බව හැඟෙනවා. විශාල ධනස්කන්ධයක් කිරිපිටි ආනයනය සඳහා වැය කරනවා. ඒ නිසා, කිරි නිෂ්පාදනය ඉහළ නංවා, දියර කිරි පරිභෝජනය වැඩි කිරීමට අපි අපේක්ෂා කරනවා.

තවද, කිරි, බිත්තර හා කුකුල් මස් නිෂ්පාදනය සඳහා පෞද්ගලික අංශයේ මධ්‍යම හා මහා පරිමාණ ආයෝජකයන් ද දිරිමත් කරන අතර, එම නිෂ්පාදන සඳහා වැයවන අමුද්‍රව්‍ය හා නව තාක්ෂණ උපකරණ පිරිවැය අවම කිරීම අවශ්‍ය වෙනවා.

ඒ අනුව, පශු සම්පත් ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා තවදුරටත් ආයෝජනය කිරීමේ අවශ්‍යතාවක් පවතිනවා. ඒ සඳහා දැනට විසර්ජන පනතින් වෙන් කොට ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 1,000 ක් වෙන් කිරීමට මම බලාපොරොත්තු වෙනවා.





ප්‍රමුඛ ක්ෂේත්‍ර

# අලුත් ආයෝජන කලාප පෙළක්

අපනයන ඉලක්ක කරගත් ආර්ථිකයක් (Export Oriented Economy) ගොඩනැඟීම සඳහා අප කටයුතු කරනවා. ඒ සඳහා රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය ඒකාබද්ධ වූ යාන්ත්‍රණයක් සකස් කොට, එක් එක් අපනයන ක්ෂේත්‍රයට අදාළව වාර්ෂික ඉලක්ක ලබා දී, ඔවුන් මුහුණපාන ගැටළු විසඳීම සඳහා නිරන්තර මැදිහත් වෙනවා.

නව නිෂ්පාදන සිදු කිරීම සඳහා ආයෝජකයන්ට අවශ්‍ය මූලික පහසුකම් ලබා දීම අපේ වගකීමක්. ඒ අනුව, අලුතින් බිහි කරන නිෂ්පාදන ආයෝජන කලාප සඳහා අවශ්‍ය කරන ඉඩම්, විදුලිය, ජලය, අභ්‍යන්තර හා බාහිර ප්‍රවේශ මාර්ග වැනි මූලික යටිතල පහසුකම් සලසා දීම වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# අත්යන්ත්‍ර රෙදිපිළි සහ බතික් කර්මාන්තයට අලුත් එළියක්

අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය අපේ රටේ දීර්ඝ ඉතිහාසයක් ඇති සාම්ප්‍රදායික කර්මාන්තයක්. ඒ වාගේම, ශ්‍රී ලාංකේය බතික් කලාවටත් දීර්ඝ ඉතිහාසයක් තියෙනවා. සැලසුම් සහගත වැඩපිළිවෙළක් තුළින් මෙම නිෂ්පාදනවලට ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොලේ හොඳ ඉල්ලුමක් ලබා ගත හැකියි. වසර 2025 දී අත් යන්ත්‍ර හා බතික් ඇතුළු නිෂ්පාදන සඳහා ඇමරිකානු ඩොලර් බිලියනයක අපනයන ආදායමක් ඉලක්ක කර තිබෙනවා.

එමනිසා, මෙම අත්යන්ත්‍ර, බතික් ඇතුළු පේෂ කර්මාන්ත දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 1,000 ක් වෙන් කිරීමට මම යෝජනා කරනවා.





# වාරි සෞභාග්‍යා

අතිගරු ජනාධිපතිතුමාගේ “ගම සමග පිළිසඳරක්” වැඩසටහනේ දී ග්‍රාමීය ප්‍රජාව විසින් හඳුනා ගනු ලැබූ වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව, උමාඔය පහළ නිම්න සංවර්ධනය, හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග පහසුකම් සංවර්ධනය, කුච්චවේලි ජේරාරු වාරිමාර්ග වේල්ල ඉදිකිරීම, කුඹුක්කන් ඔය ජලාශය සංවර්ධනය, මාදුරු ඔය දකුණ ඉවුර සංවර්ධනය, නිල්වලා ගඟ පහළ නිම්න සංවර්ධනය, 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට යෝජිත මධ්‍ය හා මහා පරිමාණ ව්‍යාපෘති වෙනවා.

“වාරි සෞභාග්‍යා” වැඩසටහන් යටතේ හඳුනාගත් කුඩා වැව්, අමුණු 5,000 ක් ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කළා. එයින්, දැනට නිම කර ඇති කුඩා වැව්, අමුණු 1050 ට අමතරව, තවත් වැව්, අමුණු 2000 ක් ලබන වසරේ නිම කිරීමට අපේක්ෂා කරනවා.

ඒ අනුව, වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මඟින් රුපියල් මිලියන 48,237 ක් වෙන් කර තිබෙනවා. ඊට අතිරේකව තවත් රුපියල් මිලියන 20,000 ක ප්‍රතිපාදනයක් වෙන් කිරීමට මා යෝජනා කරනවා. මුළු දිවයිනම ආවරණය වන සේ ක්‍රියාත්මක මෙම වාරි ව්‍යාපෘති සියල්ල 2024 වන විට අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා.



# කුඩා ආයෝජන කලාප ජාලයක් රට පුරා

නව නිෂ්පාදන ආයෝජන සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින්ට අවශ්‍ය පහසුකම් සැලසීමත්, රජයේ යුතුකමක්. දැනට, එවැනි බොහෝ කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් කොළඹ, ගම්පහ, කළුතර වැනි බස්නාහිර පළාත තුළ කර්මාන්ත ස්ථාපිත කිරීමට වැඩි නැඹුරුවක් දක්වනවා.

එහෙයින්, බස්නාහිර පළාතින් පිටත ඔවුන්ගේ කර්මාන්ත පිහිටුවීමට අවශ්‍ය ඉඩම් ලබා දීම, විදුලිය, ජලය, මාර්ග හා ආරක්ෂිත වැටවල් වැනි මූලික පහසුකම් ලබා දීම තුළින්, කර්මාන්ත නගරයෙන් ගමට ගෙන යාමට අවශ්‍ය කටයුතු සකස් කරමින් පවතිනවා.

ඒ නිසා, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත කලාප ඇති කිරීමට රජයේ අවධානය යොමු වී තිබෙනවා. මේ තුළින් ප්‍රාදේශීය මට්ටමින් සෘජු හා වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් උත්පාදනය කළ හැකිය. ඒ සඳහා රුපියල් මිලියන 5,000 ක ප්‍රතිපාදනයක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# හරිත බලශක්ති පෙරළියක්

පුද්ගලික අංශයට පුනර්ජනනීය බලශක්තිය ක්ෂේත්‍රයේ ආයෝජන අවස්ථා විවෘත කර දී තිබෙනවා. ඒ තුළින් වසර 2030 වන විට සමස්ත බලශක්ති අවශ්‍යතාවයෙන් 70% ක් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර තුළින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය ආයෝජන 2022 වර්ෂයේ දී කඩිනම් කිරීමට යෝජනා කරනවා.

පුනර්ජනනීය බලශක්තිය වැඩි දියුණු කර පෞද්ගලික අංශයේ ආයෝජන දිරිමත් කිරීම වෙනුවෙන් අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා දැනට වෙන් කර ඇති රුපියල් මිලියන 190 ට අමතරව තවත් රුපියල් මිලියන 500 ක් පමණ වෙන් කිරීමට යෝජනා කරනවා.

ඒ අනුව, පෞද්ගලික අංශයේ ද සහාය ඇතිව ඉදිරි වසර තුන (03) තුළ දී ජාතික විදුලි බල පද්ධතියට මෙගා වොට් 2,000 කට ආසන්න අමතර විදුලි ධාරිතාවක් උමා ඔය, පුනරීන්, සියඹලාණ්ඩුව, මන්නාරම, බ්‍රෝඩ්ලන්ඩ්, මොරගොල්ල හා සීතාවක යන පුනර්ජනනීය විදුලි බලාගාරවලින් ජනනය කොට ජාතික විදුලි බල පද්ධතියට එකතු කිරීමට බලාපොරොත්තු වෙනවා.



# තවත් කිලෝමීටර් 25,000 කට කාපට්

සෑම ගමක් ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කෙරෙන කිලෝමීටර් ලක්ෂයේ මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ, මෙම වර්ෂය තුළ නිමවන කිලෝමීටර් 18,000 ට, අමතරව 2022 වර්ෂයේ සිට වසරකට කිලෝමීටර් 25,000 බැගින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා.

දුෂ්කර ගම්මානවලට ප්‍රවේශ වීමට හඳුනාගෙන ඇති ග්‍රාමීය පාලම් 10,000 වැඩසටහන යටතේ දැනට නිම කර ඇති පාලම් 200 ට අමතරව ඉතිරි පාලම් කඩිනමින් ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරනවා.

කොළඹ වරාය පිවිසුම් මාර්ගය, පෑලියගොඩ - අතුරුගිරිය අධිවේගී මාර්ගය, මහනුවර අධිවේගී මාර්ගය, කුරුණෑගල - දඹුල්ල අධිවේගී මාර්ගය, රුවන්පුර අධිවේගී මාර්ගය, කොළඹ - මොරටුව වෙරළබඩ මාර්ගය හා කොළඹ නගරයේ ගුවන් පාලම් 2024 දෙසැම්බර් 31 දින වන විට නිම කරනවා.

මේ සඳහා, 2022 වර්ෂයට රුපියල් මිලියන 260,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ සඳහා තවත් රුපියල් මිලියන 20,000 ක් වෙන් කරනු ලබනවා.



# ගම සමඟ පිළිසඳර තවත් ඉදිරියට

එක් වසමකට වෙන් කර ඇති මුදල රුපියල් මිලියන තුනක් (03) වෙනවා. ඒ කියන්නේ හැම ගමකට ම රුපියල් ලක්ෂ තිහ ගානේ ලැබෙනවා, ඒ අනුව වෙන් කර ඇති මුළු මුදල රුපියල් මිලියන 42,063 කි. මෙම මුදලින් ගම තුළ ඉටු කරන සංවර්ධන ව්‍යාපෘති මොනවද යන්න තීරණය කිරීමේ බලය අප රජය විසින් ජනතා සන්තක කර තිබෙනවා. මෙහි දී ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේට, පල්ලියේ, කොවිලේ පූජකතුමන්ට, ග්‍රාමීය ප්‍රජා නායකයින්ට මෙන් ම සියලු ම ගම් වැසියන්ට ගම හදන වැඩපිළිවෙළට ඉතා සක්‍රීය ලෙස සෘජුව මැදිහත් විය හැකියි. ග්‍රාමීය රාජ්‍ය නිලධාරීන් සහ ග්‍රාමීය දේශපාලන නායකත්වය එකට හමුවන එළදායී සංවාද මණ්ඩපයක් තුළින් මෙම සංකල්පය ගම තුළ ක්‍රියාත්මක කළ හැකියි.



# ගමෙත් නගරයෙත් නිවාස ප්‍රශ්නයට උත්තරයක්

නාගරික නිවාස සංවර්ධනය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනයන්ට අමතරව තවත් රුපියල් මිලියන 2,000 ක් සහ ග්‍රාමීය නිවාස සංවර්ධනය වෙනුවෙන් තවත් රුපියල් මිලියන 5,000 ක් ද වෙන් කරනවා. කොළඹ හා තදාසන්න නගර ආශ්‍රිතව ඉදිකිරීම් ආරම්භ කර ඇති තට්ටු නිවාස සංකීර්ණ මගින් ඉදි කෙරෙන නිවාස 50,000 වැඩපිළිවෙළ 2024 වසරේ දී නිම කිරීමට සැලසුම් කර තිබෙනවා.



# නිවාස ප්‍රශ්නයට තවත් උත්තරයක්

වතුවල පවතින ලයින් කාමරවල තත්ත්වය පිළිබඳව මා ඔබට කරුණු විග්‍රහ කිරීමට අවශ්‍ය වන්නේ නැහැ. එය දරුණු බේදවාචකයක්. ඔවුන්ගේ ශ්‍රමය, අපගේ ප්‍රධාන අපනයන බෝගයක් වන තේ නිෂ්පාදනයේ මූලික යෙදවුම් අතරින් එකක්. ඒ නිසා, එම ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කිරීම අප කාගේත් වගකීමක්. ඒ අනුව, ඉදිරි වසර තුන (03) තුළ ලයින් කාමර ඉවත් කර වතු නිවාස වැඩි දියුණුව සඳහා තවත් රු. මිලියන 500ක් වෙන් කරනවා.

ඒ අනුව, අඩු ආදායම්ලාභීන්ගේ නිවාස සිහිනය සැබෑ කිරීම සඳහා නාගරික, ග්‍රාමීය හා වතු නිවාස සංවර්ධනයට 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් වෙන් කර ඇති ප්‍රතිපාදනවලට අමතරව මිලියන 500 ක් වෙන් කරනවා. එමගින්, මෙම නිවාස වැඩසටහන් වඩාත් පුළුල්ව හා කඩිනම්ව නිම කිරීමට අවස්ථාව සැලසෙනවා.

කොළඹ හා තදාසන්න නගර ආශ්‍රිතව ඉදිකිරීම් ආරම්භ කර ඇති තට්ටු නිවාස 50,000 ක නිවාස වැඩසටහන 2024 වන විට නිම කිරීමට ද සැලසුම් කර තිබෙනවා.



# නාගරික සංවර්ධනයට මිලියන 7,000 ක්

නාගරික සංවර්ධනය අපේ සංවර්ධන න්‍යාය පත්‍රයේ තවත් එක් ප්‍රමුඛ අංගයක්. ඒ අනුව, ඒකාබද්ධ වූ මාර්ග හා ප්‍රවාහන පද්ධතියක් සහිතව සුවපහසු, පරිසර හිතකාමී නාගරික වන උයන්වලින් සමන්විත සැලසුම්ගත නගර සංවර්ධන වැඩසටහන් අපි ආරම්භ කර තිබෙනවා. වත්තල, ජාඇල, කටාන, ගම්පහ, කැලණිය ජල ගැලීම්වලට ලක්වන පහත්බිම් ප්‍රදේශවල ජලාශ, ඇළ දොළ මෙන් ම හැමිල්ටන් ඇළ ආශ්‍රිත ප්‍රදේශය ද පරිසර හිතකාමී ලෙස සංවර්ධනය කරනු ලබනවා. මේ සඳහා දේශීය හා විදේශීය සෘජු ආයෝජන මෙන් ම 2022 අයවැය ඇස්තමේන්තුව යටතේ රුපියල් මිලියන 7000 ට වැඩි මුදලක් දැනටමත් වෙන් කර තිබෙනවා.



# පාර්ලිමේන්තු විමධ්‍යගත ප්‍රතිපාදන ඉහළට

සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ම සිය කොට්ඨාසය තුළ සංවර්ධන කටයුතු සඳහා රාජ්‍ය අයවැයෙන් ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන තවත් මිලියන 05 කින් වැඩි කිරීමට යෝජනා කරනවා.

පාර්ලිමේන්තුව නියෝජනය කරන මහජන නියෝජිතයන් 225 දෙනා දිස්ත්‍රික්ක මට්ටමින් ඉටු කිරීමට අපේක්ෂා කළ සංවර්ධන අවශ්‍යතාවන් වඩාත් පුළුල් පරාසයක ඉටු කර දීමට මෙමඟින් හැකි වනු ඇතැයි මම තදින් ම විශ්වාස කරනවා. එය පොදු මහජනයා ලැබූ ජයග්‍රහණයක්.

ඒ අනුව, 2022 වර්ෂය සඳහා සෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ම රුපියල් මිලියන 15 බැගින් රුපියල් මිලියන 3,375 ක මුදලක්, සංවර්ධන මූල්‍ය ප්‍රතිපාදන ලෙස හිමි වෙනවා.



# පළාත් පාලන කොට්ඨාසයටත් රුපියල් 4,000,000 ක්

මෙරට දේශපාලන ව්‍යුහයේ කුඩාතම ඒකකය, පළාත් පාලන ආයතනය යටතේ ඇති පළාත් පාලන කොට්ඨාසයයි. අපේ මුළු පළාත් පාලන කොට්ඨාස ගණන 4917 යි. මේ සෑම කොට්ඨාසයකට ම වෙන වෙනම ම මෙවර අයවැයෙන් මුදල් ප්‍රතිපාදන වෙන්කර තිබෙනවා. එක් කොට්ඨාසයකට වෙන් කර ඇති මුදල රුපියල් මිලියන හතරක්. ඒ කියන්නේ ලක්ෂ හතලිහක්. ඒ අනුව, පළාත් පාළන කොට්ඨාස 4,917 හරහා ගලා යන මුළු මුදල රුපියල් මිලියන 19,668 ක් බව සඳහන් කළ යුතුයි.




ප්‍රදේශය දක්වා

# ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ට සහන

කොවිඩ් වසංගතයේ බලපෑම හේතුවෙන් තවදුරටත් තම ව්‍යාපාර නිසි පරිදි ක්‍රියාත්මක කර ගැනීමට නොහැකිව සිටින විශේෂයෙන් ම පාර දෙපැත්තේ - කඩ මණ්ඩියක - පොඩි කරත්තයක - කඩල, වඩේ, බුලත් විට, කොළකැඳ, කඩයප්පන්, තැඹිලි, කුරුම්බා විකුණන, ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ව්‍යාපාරිකයන්ට සහන සැලසීමේ වැදගත්කම අප හඳුනාගෙන තියෙනවා. එලෙස ම, මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට ද සහන සැලසීමේ අවශ්‍යතාවය ද දකිනවා.

ඒ අනුව, විශේෂයෙන් ම, කොවිඩ් - 19 වසංගතය පාලනය සඳහා රජය විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ගවලින් සෘජු බලපෑමට ලක් වූ සෑම ක්ෂේත්‍රයක් ම නියෝජනය වන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සහන සැලසීම සඳහා වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 5,000 ක ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජනා කරනවා.





# ජීවනෝපාය සංවර්ධනයට තවත් මිලියන 19,894 ක්

මේ පිළිබඳ දැනටමත් සියලු ම දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට උපදෙස් නිකුත් කර, ඔවුන් දැනුවත් කර තිබෙනවා. ඒ අනුව, ඔවුන් ඇතුළු සියලු නිලධාරීන් නව ජවයකින් යුතුව ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීමට කටයුතු සූදානම් කරමින් සිටිනවා. දිස්ත්‍රික්ක 25 ආවරණය වන සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා තවත් රුපියල් මිලියන 19,894 වෙන් වෙනවා.

මේ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමට පාදක කර ගෙන ඇත්තේ එක් එක් දිස්ත්‍රික්කයේ භූමිය, ජනගහනය සහ අනෙකුත් සමාජ සහ ආර්ථික සාධක සියල්ලයි.



# ත්‍රීරෝද රථ හිමියන්ට මිලියන 600 ක සහනයක්

විශේෂයෙන් ම, ත්‍රීරෝද රථ වෘත්තිකයන් අපේ එදිනෙදා ජීවිතයේ අත්‍යවශ්‍ය සේවයක් සපයන්නන් වෙනවා. දළ දේශීය නිෂ්පාදිතයේ සේවා අංශයේ ඉහළ ම දායකත්වය දක්වන්නන් ඔවුන්. එහෙත්, පසුගිය කාලය තුළ ත්‍රීරෝද රථ ධාවනය කිරීමට නොහැකිවීම හේතුවෙන් ආදායම් අහිමි වූ ත්‍රීරෝද රථ හිමියන්ට සහන සැලසීම සඳහා රුපියල් මිලියන 600 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# පාසල් වෑන් රථ හිමියන්ගේ හිසරදය අවසන්

පසුගිය කාලය තුළ පාසල් වසා තැබීම හේතුවෙන් පාසල් වෑන් රථ හා බස් රථ හිමියන්ට තමන්ගේ ආදායම සම්පූර්ණයෙන් ම අහිමි වුණා. ජීවන වෘත්තිය අහිමි වීමට අමතරව ලීසිං වාරික ගෙවීම හා වාහන නඩත්තුව සම්බන්ධයෙන් ද ඔවුන් අනපේක්ෂිත දුෂ්කරතාවයකට මුහුණ දුන් බව අපි තේරුම් ගත යුතුයි. මෙම ගැටලුව කෙරෙහි සංවේදී වෙමින් පාසල් වෑන් සහ බස් රථ හිමියන්ට සහන සැලසීම සඳහා රුපියල් මිලියන 400 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



ඔබට අය වැයෙන්

# මෙන්න තවත් විශේෂ සහනයක්

කලා නිර්මාණ සහ විනෝදාස්වාදය මත පදනම් වූ ක්ෂේත්‍ර සහ උත්සව සේවා සැපයු අංශ Wedding and Event Management කර්මාන්තය කෝවිඩ් වසංගතය හේතුවෙන් මුළුමනින් ම ඇණහිට තිබෙනවා. ඒ හේතුවෙන් රැකියා සහ ආදායම් අහිමිවීම අතිශයින් ම බරපතල අවධියක පවතිනවා. එම ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික මෙවලම් පද්ධති හා අනෙකුත් සම්පත් නඩත්තුව අඩාලවීම හේතුවෙන් එම වෘත්තීය කටයුතු නැවත ආරම්භය ද සංකීර්ණ තත්ත්වයක පවතිනවා. ඇතැම්විට සුපුරුදු කටයුතු නැවත ආරම්භය වෙනුවෙන් අමතර වියදම් දැරීමට පවා සිදුවනු ඇති. මේ නිසා, කලා ශිල්පීන් රැසක් දැඩි පීඩාවකට ලක්ව සිටිනවා.

සියල්ලන්ගේ ම යහපත වෙනුවෙන් පළමුව කළ යුත්තේ මෙම වෘත්තීය කටයුතු කඩිනමින් නැවත ආරම්භ කිරීමයි. ඒ සඳහා පහසුකම් සැපයීමට අදාළව එන්නත්කරණය ඇතුළු මූලික වගකීම් මේ වන විටත් අපේ ආණ්ඩුව විසින් සාර්ථකව ඉටු කර තිබෙනවා. නමුත්, තවදුරටත් ඉටු කළ යුතු කාර්ය භාරයක් අප හමුවේ පවතිනවා. ඒ වෙනුවෙන් පහසුකම් සැපයීමටත් දිරිගැන්වීම් සඳහාත් රුපියල් මිලියන 500 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# පුද්ගලික බස් රථ හිමියන්ට මිලියන 1500 ක සහනයක්

පෞද්ගලික බස් රථ හිමියන් අපේ රටේ මගීන් ප්‍රවාහන සේවය තුළ ඉටු කරන කාර්ය භාරය ඉතා වැදගත්. රට වසා තැබීම සහ නිරෝධාන නීති පැනවීම හේතුවෙන් පෞද්ගලික බස් රථ කර්මාන්තයට ඇති වූ අහිතකර බලපෑම බරපතලයි. ජනතාවාදී ආණ්ඩුවක් ලෙස අපි මේ අර්බුදකාරී තත්ත්වය මැනවින් අවබෝධ කරගෙන තිබෙනවා. පෞද්ගලික බස් රථ හිමියන් සඳහා රාජ්‍ය අයවැයෙන් මුදල් වෙන් කිරීමට අපි තීරණය කරන්නේ ඒ අනුවයි. පෞද්ගලික බස් රථ හිමියන් සඳහා පහසුකම් සහ සහන සැලසීමට රුපියල් මිලියන 1500 ක් කිරීමට යෝජනා කරනවා.



# ගහකොළ සහ සිව්පාවුන්ටත් සහනයක්

රටේ ජනඝනත්වය වැඩි වීමත් සමග ජනාවාස පුළුල් වීම නිසා වනගහනයට ඇති කරන බලපෑම අති ප්‍රබලයි. මේ නිසා, අපේ පවතින වනාන්තර ආරක්ෂා කර ගනිමින්, දැනට ඇති වනගහනය 30% දක්වා ඉහළ නැංවීම, ජල පෝෂක ප්‍රදේශ සුරක්ෂිත කිරීම, ආක්‍රමණික ශාක ඉවත් කර හිතකර ශාකවලින් වනගහනය වැඩි කිරීම අවශ්‍ය වෙනවා.

මේ සඳහා වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 2,000 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.

වනජීවීන්ට අවශ්‍ය ආහාර හා ජලය වනාන්තර තුළින් ම සලසා ගැනීම සඳහා කුඩා වැව් හා වන සත්ත්ව වාසස්ථාන වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරනවා. වගාවන්ට හානි කරන සත්ත්වයින් පාලනය කරන අතරතුර, වන ජීවීන් ආරක්ෂා කර ගැනීම අපේ යුතුකමක් හා වගකීමක්. මේ නිසා, වනජීවී සංරක්ෂණය සඳහා වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 1,000 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# පරිසරප්‍රේමී අයවැයක්

පරිසරයට අපද්‍රව්‍ය බැහැර කිරීම ජාතික ප්‍රශ්නයක් බවට පත්ව තිබෙනවා. ජල සංරක්ෂණය, පාංශු සංරක්ෂණය, ශබ්ද කළමනාකරණය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළු නගර අලංකරණය කරන නාගරික වන උයන් කෙරෙහි අපේ අවධානය යොමු කරනු ලබනවා. “සුරකිමු ගංගා” සංරක්ෂිත වැඩසටහන යටතේ දිවයිනේ ගංගා 103 ක් හා ගංගා නිම්න පරිසර හිතකාමී ලෙස සංරක්ෂණය කිරීමත්, මුතුරාජවෙල පරිසර සංවේදී කලාප සංරක්ෂණය කර රැම්සා තෙත් බිමක් ලෙස සංවර්ධනය කිරීමට ප්‍රමුඛත්වය දී තිබෙනවා. ඒ අනුව, පරිසර සංරක්ෂණයට වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 2,000 ක් වෙන් කරනු ලබනවා.



# සුවපත් දැයක් වෙනුවෙන්

සෞඛ්‍ය අංශය යටතේ ළමා හා මාතෘ සායන, ග්‍රාමීය රෝහල්, ඩිස්පැන්සරි, සෞඛ්‍ය වෛද්‍ය කාර්යාල, ආයුර්වේද බෙහෙත් ශාලා, යෝග / මානසික සුවතා මධ්‍යස්ථාන වැනි ජනතාවගේ කායික හා මානසික සුවය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ආයතනවල සංවර්ධන කටයුතු සඳහා වෙන් කර ඇති රුපියල් මිලියන 32,650 ට අමතරව තවත් රුපියල් මිලියන 5,000 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# අධ්‍යාපන සංවර්ධනයට සුවිශේෂී අවධානයක්

2022 වසරේ ජාතික පාසල් 1,000 ක් ඇති කිරීම සඳහා රුපියල් මිලියන 2,200 ක් විසර්ජන පනත මගින් වෙන් කර ඇති අතර, වසර තුනක් (03) තුළ මෙම වැඩසටහන කඩිනමින් ක්‍රියාත්මක කර අවසන් කිරීමට බලාපොරොත්තු වෙනවා. එම වැඩසටහන කඩිනම් කිරීම ඇතුළු අධ්‍යාපන අංශයේ සංවර්ධනය සඳහා වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 5,300 ක මූල්‍ය ප්‍රතිපාදනයක් අයවැය යෝජනාවක් ලෙස ඇතුළත් කිරීමට යෝජනා කරනවා.



# සුළු වාරිමාර්ග සංවර්ධනයට තවත් මිලියන 2,000 ක්

සුළු වාරිමාර්ග අංශය යටතේ කුඩා වැව්, ඇනිකට්, ඇලවේලි ප්‍රතිසංස්කරණය, වැව් බැම් ආරක්ෂා කිරීම සහ ජල පෝෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දැනට වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 2,000ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# ක්‍රීඩා පහසුකම් සංවර්ධනය

නිරෝගී, කායික හා මානසික සෞඛ්‍ය පවත්වා ගැනීම සඳහා ක්‍රීඩාව අත්‍යවශ්‍ය වෙනවා. නගරයේ මෙන් ම ගමේ ද ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම අපේ වගකීමක්. ඒ නිසා ක්‍රීඩා අංශය තුළ ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා පිටි සංවර්ධනයත්, ගෘහස්ථ ක්‍රීඩා පහසුකම් සංවර්ධනය පිළිබඳවත් අවධානය යොමු කරනු ලබනවා. ඒ අනුව, දැනට වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 3,000 ක් ක්‍රීඩා පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කිරීමට යෝජනා කරනවා.



# සුවපහසු ගමනක්

පොදු ප්‍රවාහන අංශය මෙන් ම, පෞද්ගලික අංශය සදහා ප්‍රවාහන අවකාශයේ පවත්නා අවස්ථාවන් හදුනාගනිමින්, ඒවා පුළුල් කිරීම ඉතා වැදගත් කොට සලකනවා. නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ අතර මනා වූ සම්බන්ධීකරණයක් ඇති කරමින් මහජනතාවට සුවපහසු, කාර්යක්ෂම හා විනයගරුක ප්‍රවාහන සේවාවක් ලබා දීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවාවන් නව තාක්‍ෂණික ක්‍රමවේදයන්ට අනුගත වෙමින් පවත්වාගෙන යාම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් වෙන් කරන ලද ප්‍රතිපාදනවලට අමතරව තවත් රුපියල් මිලියන 2,000 ක් වෙන් කර දීමට යෝජනා කරනවා.



# නැවුම් වෘත්තීය අධ්‍යාපන ප්‍රවේශයක්

කුසලතා පූර්ණ තරුණ පරම්පරාවක් රටේ සංවර්ධනයට අත්‍යවශ්‍යයි. කුසලතා පූර්ණ ශ්‍රම බලකායක් රටට වත්කමක්. කුසලතා පූර්ණ ශ්‍රමය තුළින් ලැබෙන විදේශ විනිමය ඉතා ඉහළයි. බහුවිධ කුසලතා සහිත තරුණ ශ්‍රමයට පෞද්ගලික අංශයේ ද විශාල ඉල්ලුමක් පවතිනවා.

ඒ නිසා, පාසල් අධ්‍යාපනයෙන් පසු වෘත්තීය හා තාක්ෂණික කුසලතා අත්පත් කර ගැනීම සඳහා දැනට සපයා ඇති පහසුකම් වැඩි දියුණු කිරීමටත්, නගර විශ්ව විද්‍යාල හා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපන පහසුකම් ඇති කිරීමටත් දැනට වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 2,000 ක් වෙන් කිරීමට බලාපොරොත්තු වෙනවා.



# මහජන ආරක්ෂාව, නීතිය හා සාමය වෙනුවෙන්

මහජන ආරක්ෂාව සඳහා රජය ඉහළ ම ප්‍රමුඛතාවය ලබා දී තිබෙනවා. ඒ සඳහා පිහිටුවා ඇති ආයතන මහජන ආරක්ෂාව සඳහා මෙන් ම, ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් විශාල කාර්යභාරයක් මේ වන විට ඉටු කරමින් සිටිනවා.

මත්ද්‍රව්‍ය හා අපරාධ වැළැක්වීම සඳහා ග්‍රාමීය ජනතාව සමඟ සහයෝගයෙන් ක්‍රියා කළ හැකි ප්‍රජා පොලිස් සේවාවක් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරනවා. ග්‍රාමීය මට්ටමෙන් ආරම්භ කෙරෙන මෙම ප්‍රජා පොලිස් සේවාවන්ට අවශ්‍ය පහසුකම් හා පොලිස් නිලධාරීන් බඳවා ගැනීමට වෙන් කරන ලද රුපියල් මිලියන 7,885 අමතරව, තවත් රුපියල් මිලියන 500 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# අධිකරණ යටිතල පහසුකම් හා ප්‍රතිසංස්කරණ

අධිකරණ ක්‍රියාවලිය තුළ සිදුවිය හැකි ප්‍රමාදයන් වළක්වා ගැනීමත්, අකාර්යක්‍ෂමතාවන් පිටුදැකීම සඳහාත්, අධිකරණ කටයුතු සඳහා විශාල මුදලක් වෙන් කරනු ලැබුවා. එමගින් අපරාධ, සිවිල් හා වානිජ නීති ප්‍රතිසංස්කරණ කටයුතුවලට අවශ්‍ය මානව සම්පත් වැඩිදියුණු කිරීමටත්, ඩිජිටල්කරණය මගින් උසාවි කටයුතු කාර්යක්‍ෂම කිරීමත්, අධිකරණ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආරම්භ කර ඇති වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වා ගැනීම සඳහාත් වෙන් කරන ලද රුපියල් මිලියන 6,937 ට අමතරව තවත් රුපියල් මිලියන 5,000 ක මුදල් ප්‍රතිපාදන සලසා දීමට යෝජනා කරනවා.



# අලුත් සමාජ ආරක්ෂණ සංකල්පයක්

රාජ්‍ය ආදායම දැඩිසේ සීමා වී තිබුණ ද එයින් බාධාවක් ඇති නොවන ආකාරයට වැඩිහිටියන් සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ලද සුබසාධන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට රජය ක්‍රියා කරනු ලබනවා. එසේ ආදායම අනපේක්ෂිත ලෙස පහත වැටුණු තත්ත්වයක් තුළ දී වුවත්, මෙම සුබසාධන වැඩසටහන නවතා දැමීමට රජය කිසි විටෙක උත්සාහ දැරුවේ නැති බව මෙහි දී සඳහන් කරනවා.

ඒ අනුව, තවදුරටත් වැඩිහිටි ප්‍රජාව ආරක්ෂා කිරීම හා විශේෂ අවශ්‍යතා සහිත අයට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා රුපියල් මිලියන 1,000 ක ප්‍රතිපාදන වෙන් කිරීමට යෝජනා කරනවා.

මෙමගින්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට තම කාලය, සතුටින් සෞඛ්‍ය සම්පන්නව ගත කිරීමට හැකි වන පරිදි ග්‍රාමීය මට්ටමින් සුදුසු ස්ථාන ඇති කිරීමටත්, විශේෂ අවශ්‍යතා සහිත අය සඳහා සෞඛ්‍යාරක්ෂාව සැලසෙන ආකාරයට පහසුකම් වැඩි දියුණු කිරීමටත් අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීමට අප මේ ඔස්සේ බලාපොරොත්තු වෙනවා.



# සිරකරුවෝ ද මනුෂ්‍යයෝය

බන්ධනාගාර රැඳවියන්ගේ සංඛ්‍යාව ඉහළ යාම නිසා බන්ධනාගාර තුළ ඇති වන තදබදයට සමගාමීව සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවීම පිළිබඳ ගැටළු පවතින බව වාර්තා වෙනවා. එබැවින්, සියලු ම බන්ධනාගාරවල රැඳවියන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනවලට අමතරව රුපියල් මිලියන 200 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.




ඔබට අය වැයෙන්

ඔබට අය වැයෙන්

# විශේෂ ජීවන සහනාධාරයක්

බාහිර හවිහරණක් නැතිව දෛනික ජීවන අවශ්‍යතාවයන් සපුරාගත නොහැකි සැලකිය යුතු පිරිසක් අපේ සමාජයේ සිටිනවා. ඔවුන් එම තත්වයට පත්වීමට බලපා ඇති හේතු විවිධාකාර විය හැකියි. කෙසේ වෙතත් ඔවුන් පිළිබඳව සාධාරණ අවධානයක් යොමු නොවීම අපි බරපතල ලෙස සැලකිල්ලට ගත යුතුයි. දෛනික ආහාර අවශ්‍යතාවයන් සපුරාගැනීමේදී පවා ඔවුන් දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බව අප පිළිගත යුතුයි.

එවැනි පවුල් විධිමත් පදනමක් මත නිශ්චිතව හඳුනාගෙන ජීවන සහනාධාරයක් සැපයීමට අපගේ රජය සූදානම්. මෙම සුවිශේෂී සහනාධාරය වෙනුවෙන් රුපියල් මිලියන 15,000 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# ගැබිණි මාතා - පෝෂණ මල්ල

ගෘහ ආර්ථික සුරක්ෂිතතා වැඩසටහනේ ඉහළම ප්‍රමුඛත්වය හිමිවන්නේ මවගේ මූලිකත්වයෙන් යුත් ලාංකේය මතු පරපුරේ පෝෂණය වෙනුවෙන්. සැබවින් ම, රටකට අවශ්‍ය වන්නේ බුද්ධිමත් පරපුරක්. උපදින දරුවාගේ බුද්ධි වර්ධනය වැඩි වශයෙන් සිදුවන්නේ මවගේ කුස තුළ දී හා ප්‍රසූතිය සිදු වී මුල් කාලයේ දී. එබැවින්, උපදින දරුවාගේ හා මවගේ පෝෂණය ඉතා වැදගත්.

ඒ නිසා, ගැබිණි මාතාවන්ට දැනට මාස 10 ක් දක්වා පමණක් ලබා දෙන රුපියල් 10,000 ක් වටිනා පෝෂණ මල්ල මාස 24 ක්, එනම්, වසර දෙකක් (02) දක්වා දීර්ඝ කර, අඛණ්ඩව ලබා දීමට යෝජනා කරනවා.

ඒ අනුව, මෙම වැඩසටහන සඳහා දැනට වෙන් කර ඇති රුපියල් මිලියන 4,000 ප්‍රතිපාදනවලට අමතරව රුපියල් මිලියන 1,000 ක් වෙන් කරනවා.



# රාජ්‍ය සේවය ඩිජිටල්කරණයට

කාර්යක්ෂම හා ඵලදායී මහජන සේවාවක් අපේක්ෂාවෙන් විශාල වියදමක් දරමින් රාජ්‍ය සේවාවන් පවත්වාගෙන ගිය ද, දැඩි නීතිරීති, දීර්ඝ හා යල්පැන ගිය පරිපාලන ක්‍රම හා ක්‍රියාපටිපාටි හේතුවෙන් මහජනාවට තම අවශ්‍යතා සඳහා රාජ්‍ය ආයතන හා සම්බන්ධ වීමේ දී දැඩි ශ්‍රමයක්, කාලයක් සහ පිරිවැයක් දැරීමට සිදුව තිබෙනවා.

එහෙයින්, රාජ්‍ය සේවයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නංවා, සේවාලාභියා කේන්ද්‍රී කර ගත් රාජ්‍ය සේවාවක් ගොඩනැගීමට සහ රාජ්‍ය සේවය ඩිජිටල්කරණය සඳහා අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර ඇති රුපියල් මිලියන 3,500 ට අමතරව, තවත් රුපියල් මිලියන 500 ක් වෙන් කරනවා.



# HOME SHOP රටපුරා

කාන්තා ව්‍යවසායකයින් මූලික කර ගත් ආර්ථික සංවර්ධන නව වැඩපිළිවෙළක් අපි දිවයින පුරා ක්‍රියාත්මක කරනවා.

පසුගිය වසංගත සමයේ දී, ගමට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදා හැරීමේ දී මුහුණපෑමට සිදු වූ අත්දැකීම් මෙම වැඩසටහන සඳහා පාදක වුණා. ඒ අනුව,

- ග්‍රාමීය ජනතාවගේ ආහාර අවශ්‍යතා සපුරාලන
- ගමේ ම නිෂ්පාදිත ආහාර ද්‍රව්‍ය, භාණ්ඩ ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය අලෙවි කරන,
- තොරතුරු තාක්ෂණයෙන් ජාල ගතව, ප්‍රධාන සැපයුම් ජාලය හා ඒකාබද්ධ වූ
- ඕනෑම ව්‍යවසන අවස්ථාවක දී වුව ද, අඛණ්ඩ සැපයුම හා බෙදා හැරීම තහවුරු කරන,

කුඩා සුපිරි වෙළඳසැල් ජාලයක් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ස්ථාපිත කිරීමේ මෙම වැඩසටහන සඳහා රුපියල් මිලියන 15,000 ක පමණ ප්‍රතිපාදනයක් වෙන් කරනවා.



# ගුරු-විදුහල්පති වැටුප් විෂමතාව අවසන්

ගුරු - විදුහල්පති සේවාවන්හි වැටුප් විෂමතා ඉවත් කරන ලෙස ඉල්ලා දියත් කර තිබූ වෘත්තිය සමිති උද්ඝෝෂණය අවසන් කර, රජය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගනු ලැබූ 2021-08-30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා තවත් රුපියල් මිලියන 30,000 ක් වැටුප් ලෙස ඇතුළත් කිරීමට යෝජනා කරනවා.

එය ගුරු හා විදුහල්පති වැටුප් සඳහා දැනට දරනු ලබන රුපියල් මිලියන 109,000 ක අධික මුදලටත්, අමතරවයි.



# රාජ්‍ය සේවක යතුරුපැදි සහනය යළිත්

ක්ෂේත්‍රයේ රාජකාරී කළ නිලධාරීන් විසින් ලබාදෙන මහජන සේවාවන් වඩාත් කාර්යක්ෂමව සිදු කිරීම පිණිස යතුරුපැදි ලබා දීමේ වැඩසටහනක් අප විසින් 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක කරනු ලැබුවා. ඒ යටතේ, ක්ෂේත්‍ර නිලධාරීන් 146,381 දෙනෙකු සඳහා යතුරුපැදි ලබා දුන් අතර, ඔවුන් අදටත් එම යතුරුපැදි භාවිතයෙන් මහජන සේවා සපයනු දැකීම සතුටට කරුණක්.

මෙම වැඩසටහන නැවතත් ක්‍රියාත්මක කර එහි ප්‍රතිලාභ රජයේ සේවකයින්ට ලබා දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි මාගේ අවධානය යොමු වී තිබේ. ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීම පිණිස රුපියල් මිලියන 500 ක් වෙන් කිරීමට මම යෝජනා කරමි.



# පළිගැනීමට ලක්වූවන්ටත් අස්වැසිල්ලක්

ජයග්‍රාහකයා විසින් ප්‍රතිවාදින් පීඩනයට ලක් කිරීම නූතන සමාජය ඉතා පිළිකුළින් යුතුව හෙලා දකින තත්ත්වයක්. නමුත් පසුගිය පාලන සමයේ මෙරට තුළ ප්‍රතිවාදී දේශපාලන මතධාරීන් ඉතා අමානුෂික ලෙස පීඩාවට ලක් කළා. ඔවුන්ගේ පරපීඩක මානසිකත්වය අපට තේරුම් ගත නොහැකි තරම්. එම යුගය තුළ අසාධාරණයට ලක් වූවන්ට සහ විවිධ පීඩාවන්ට ගොදුරුවූවන්ට සහන සැලසීම අපගේ යුතුකමක් බවට පත්ව තිබෙනවා. ඒ සියල්ලන් වෙත යුක්තිය ඉටු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 100 ක් වෙන් කිරීමට කටයුතු කරනු ලබනවා.



# සියලු උපාධිධාරීන්ට ස්ථිර පත්වීම්

දැනටමත්, අභ්‍යාසලාභීන් ලෙස රජයට බඳවාගෙන ඇති 53,000 ට අධික උපාධිධාරීන් වෙත 2022 වසරේ ජනවාරි මස සිට ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට කටයුතු කරනවා.

ඒ සඳහා, රුපියල් මිලියන 27,600 ක් පමණ වැය වෙතැයි අපේක්ෂා කරන අතර, එම මුළු ප්‍රතිපාදනය මෙවර අයවැයෙන් වෙන් කිරීමට කටයුතු කරනවා. ඒ අනුව, දැනට වෙන් කර ඇති රුපියල් මිලියන 20,000 මුදලට අමතරව තවත් රුපියල් මිලියන 7,600 ක් ඒ සඳහා වෙන් කරනවා.



# සංස්කෘතියේ මුදුන්මල්කඩ වෙත ගෞරවයෙන්

අපේ ශිෂ්ඨාචාරය ගොඩනැගී තිබෙන්නේ ගමේ පන්සල මූලික කරගත් සංස්කෘතික පදනමක් මතයි. ඒ සංස්කෘතිය ඉතාම පොහොසත්. නමුත් අදටත් දුෂ්කර ප්‍රදේශවල බෞද්ධ විහාරස්ථාන හා සිද්ධස්ථාන රැසක් මූලික පහසුකම් සම්පාදනය කරගැනීම සම්බන්ධයෙන් පවා විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ දෙනවා. එවැනි පසුබිමක් යටතේ පවතින දුෂ්කර ප්‍රදේශවල බෞද්ධ විහාරස්ථාන හා සිද්ධස්ථාන සඳහා පහසුකම් සැපයීමට රුපියල් මිලියන 500 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# විශ්‍රාම වැටුප් විෂමතාවත් අවසන්

දීර්ඝ කාලයක් තිස්සේ විශ්‍රාමිකයින් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් වන විශ්‍රාම වැටුප් විෂමතා නිවැරදි කිරීමට සුදුසු ක්‍රමවේදයක් කෙරෙහි රජයේ අවධානය යොමු කර තිබෙනවා. ඒ අනුව, විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ මූලික කටයුතු සඳහා රුපියල් මිලියන 500 ක් වෙන් කිරීමට කටයුතු කරනු ලබනවා.



# වෘත්තියවේදීන්ගේ සංගම්වලට රාජ්‍ය රැකවරණයක්

රටේ සංවර්ධනය සඳහා වෘත්තීයවේදීන් දක්වන දායකත්වය සුවිශේෂීයි. වෘත්තීයවේදීන්, ව්‍යාපාරිකයින් නොවේ. ඔවුන්ගේ වෘත්තීය දැනුම නව පරම්පරාවට ගලා යා යුතුයි. ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය ආයතන සමඟ සම්බන්ධ වී ගෝලීය නව දැනුම මේ රටට ලබා දීම ඔවුන්ගේ වගකීමයි.

මෙම වෘත්තීයවේදීන්ගේ කාර්යභාරය ඉටු කිරීම පහසු කරලීම උදෙසා වෘත්තීයවේදීන්ගේ සංගම්වලට රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදනයක් අයවැය යෝජනා ලෙස ඇතුළත් කිරීමට මම යෝජනා කරනවා.



# විවිධ කාලවල අතුරුදහන් වූවන් සඳහා වන්දි ගෙවීම හා හානිපූර්ණය

විවිධ හේතු මත, විවිධ කාලවල අතුරුදහන් වූවන් සඳහා වන්දි ගෙවීම සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කරනවා. එසේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල්වලට සාධාරණයක් ඉටු කිරීම සඳහා වෙන් කර ඇති මුදලට අමතරව තවත් රුපියල් මිලියන 300 ක් වෙන් කිරීමට යෝජනා කරනවා.



# ඔබට

## අය වැයෙන්

2 0 2 2

ගරු මුදල් අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කල

# විශේෂ ප්‍රතිපත්තිමය යෝජනා

- ඉතිරිකිරීමේ සංස්කෘතියක් වෙනුවෙන් රාජ්‍ය මට්ටමින් දිරිගැන්වීම.
- රාජ්‍ය ව්‍යවසායන්හි ව්‍යාපාර නැඹුරුව සහ මූල්‍ය විනය සංවර්ධනය කිරීම.
- ඌන උපයෝජිත රාජ්‍ය වත්කම් ඵලදායී පූර්ණ උපයෝජනයකට ලක් කිරීම.
- අමාත්‍යවරුන්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ මාසික ඉන්ධන දීමනාවෙන් ලීටර් 5ක් කපා හැරීම.
- විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීමේ වසර 5 සීමාව අහෝසිකර එය වසර 10 දක්වා දීර්ඝ කිරීම.
- සෑම රාජ්‍ය ආයතනයක් සඳහාම පාරිභෝගික සේවා පොරොන්දු පත්‍රයක් සකස් කිරීම.
- රාජ්‍ය සේවකයින්ට කාර්යසාධනය මත දිරිගැන්වීම් සහ උසස්වීම් ලබා දීම.
- රාජ්‍ය සේවයේ සියලු විෂමතාවන් ඉවත්කර නව වැටුප් ව්‍යුහයක් ඇති කිරීම.
- රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වර්ධක නිසි දිනට ලබාදීම වෙනුවෙන් වැටුප් පරිපාලන ක්‍රමවේද සරල කිරීම.
- මහජන සේවාවන් පසු විපරමට ඒකාබද්ධ ප්‍රතිපල පාදක ඇගයීම් කළමනාකරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම.
- ආයු අපේක්ෂාව ඉහල යාම සැලකිල්ලට ගනිමින් රාජ්‍ය සේවයේ විශ්‍රාම වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම.
- සමෘද්ධි ව්‍යාපාරය නවීකරණය කර ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයක් දක්වා පුළුල් කිරීම.
- සමෘද්ධි බැංකු ව්‍යාපාරය ග්‍රාමීය ජනතාවගේ ආසන්නතම මූල්‍ය සැපයුම් කරුවා ලෙස දියුණු කිරීම.
- සමුපකාර ව්‍යාපාරය වඩාත් ශක්තිමත් කිරීම උදෙසා අවශ්‍ය ප්‍රතිසංවිධාන කඩිනමින් සිදු කිරීම.
- ශ්‍රී ලංකා රේගුවට ගෝලීය රේගු මෙහෙයුම් ක්‍රමවේද සහ තාක්ෂණික පද්ධති තවදුරටත් ඇතුලත් කිරීම.
- බදු ගෙවන්නන්ගේ පහසුව වෙනුවෙන් බදු පරිපාලන තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වාදීම.

- මුළු රටම ආවරණය කරමින් අධිවේගී අන්තර්ජාල පහසුකම් සැපයීම.
- දිවයිනේ සැම පාසලකටම අධිවේගී (Fiber Optic) අන්තර්ජාල පහසුකම් සැපයීම.
- සියලූ පාර්ශ්වයන්හි පහසුව වෙනුවෙන් ත්‍රිරෝද රථ නියාමන අධිකාරියක් ස්ථාපිත කිරීම.
- විශ්‍රාම වැටුම් නොලබන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පනතක් හඳුන්වා දීම.
- ළමා සහ මානසික සෞඛ්‍ය සංවර්ධනයට අදාළ සාමුහික ක්‍රියාමාර්ග ඇතුලත් වැඩපිළිවෙලක් හඳුන්වා දීම.
- නව ව්‍යාවසාය ඇරඹුම් දිරිගැන්වීමට 2022 වසර සඳහා ව්‍යාපාර ලියාපදිංචි ගාස්තු අය නොකිරීම.
- ආයෝජකයින් සහ නිෂ්පාදන දිරිගැන්වීම වෙනුවෙන් අදාළ ආයතනික ක්‍රියාවලීන් සරල කිරීම.
- ඖෂධ මිල ස්ථාවරව පවත්වාගෙන යාම සඳහා සුදුසු මිල යාන්ත්‍රණයක් කඩිනමින් හඳුන්වා දීම.
- ශ්‍රී ලංකාව ලොව අංක එකේ මැණික් වෙළඳපොළ බවට පත්කිරීම.
- ශ්‍රී ලංකාව සුවතා සංචාරක (Wellness Tourism) කේන්ද්‍රයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.
- ආයුර්වේද හා පාරම්පරික හෙළ වෙදකම් ප්‍රතිකාර මධ්‍යස්ථාන අලුතින් ඇති කිරීම.
- නාවුක, ගුවන්, බලශක්ති, වාණිජ සහ දැනුම් යන පංචබල ආර්ථික කේන්ද්‍රයන් තවදුරටත් දියුණු කිරීම.
- තොරතුරු තාක්ෂණ නිපැයුම්වලින් උපයන විදේශ විනිමයට අදාළ විශේෂ බාධා ඉවත්කිරීම.
- අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් ක්ෂේත්‍රය වෙනුවෙන් ආයෝජකයන් දිරිගැන්වීම.
- විදේශ සේවා නියුක්තිකයන් වෙනුවෙන් රජයේ පහසුකම් තවදුරටත් වැඩිදියුණු කිරීම.
- තිරසාර සංවර්ධන සහ හරිත ආර්ථික ප්‍රතිපත්ති සඳහා ඉහළම ප්‍රමුඛත්වය ලබාදීම.
- රාජ්‍ය සේවකයින්ගේ වෘත්තීය සමිති අයිතිවාසිකම්වලට අදාල සියලු බාධක ඉවත් කිරීම.

**2022 අයවැය**

**නව රජයේ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන**

රු. මිලියන

| | ප්‍රධාන වැඩසටහන | මෙම සංවර්ධන කාර්යයන් සඳහා 2022 ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | අයවැය යෝජනාව සඳහා යෝජිත ප්‍රතිපාදනය | අංශය සඳහා 2022 ඇස්තමේන්තු ගත මුළු ප්‍රතිපාදනය |
|---|---|---|---|---|
| **1** | **නිෂ්පාදන ආර්ථිකය හා ජීවනෝපාය සංවර්ධනය** | | | **33,000** |
| I | **කෘෂිකර්ම** | | | |
| | a වස විස වලින් තොර වල්නාශක පරිහරණ ක්‍රම දිරිගැන්වීම සඳහා ගොවි ජනතාව වෙත සහන සැලසීම | | 4,000 | |
| | b කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය (වස විස වලින් තොර ආහාර වේලක්) | 35,000 | | |
| | c නව කෘෂි තාක්ෂණය හඳුන්වාදීම | 17,005 | 5,000 | |
| II | වැවිලි - තේ,පොල්,රබර්,කුරුඳු, ගම්මිරිස්, කෝපි, පැඟිරි, වැනිලා, එනසාල්, කරුබුනැටි වැනි අපනයන භෝග,නව වගාව,නැවත සිටුවීම, පාළු සිටුවීම හා ජල සැපයුම හා සහනාධාර ලබා දීම. | 4,359 | 10,000 | |
| III | **ධීවර** | | | |
| | a ජලාශවල මත්ස්‍ය පැටවු දැමීම | | 1,000 | |
| | b ධීවර නැංගුරම්පළවල් හා ධීවර වරායන් ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම | 675 | | |
| IV | පශු සම්පත් සංවර්ධනය (බිත්තර/කිරි/මස්වලින් ස්වයංපෝෂිත වීම) | 800 | 1,000 | |
| V | පාරම්පරික ගෘහ කර්මාන්ත දියුණු කිරීම - වේවැල්/මැටි/පිත්තල/ලාක්ෂ/වෙස්මුහුණු /පොල්කටු / ස්වර්ණාභරණ/ ගල්කැටයම්/ පන් හා දුම්බර රටා ඇතුළු ගෘහ කර්මාන්ත | 405 | 1,000 | |
| VI | අත්යන්ත්‍ර,බතික් ඇතුළු පේෂකර්මාන්තය දියුණු කිරීම | | 1,000 | |
| VII | නව නිෂ්පාදන ආයෝජන කලාප (ඉඩම්/විදුලිය/ජලය/ මාර්ග හා ආරක්ෂිත වැටවල් වැනි මූලික යටිතල පහසුකම් සැපයීම) | | 5,000 | |
| VIII | ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප ඇති කිරීම - (ඉඩම්/විදුලිය/ජලය/ මාර්ග හා ආරක්ෂිත වැටවල් වැනි මූලික යටිතල පහසුකම් සැපයීම ) | | 5,000 | |
| **2** | **මූලික යටිතල පහසුකම්** | | | **63,000** |
| I | සැමට පානීය ජලය | 33,963 | 15,000 | |
| II | වාරි සෞභාග්‍යා | 48,237 | 20,000 | |
| III | මාර්ග | 260,000 | 20,000 | |
| IV | පුනර්ජනනීය බලශක්තීන් සංවර්ධනය කිරීම (සැමට විදුලිය) | 190 | 500 | |
| V | නාගරික සංවර්ධන හා නිවාස | 29,062 | | |
| | a නාගරික නිවාස | 13,600 | 2,000 | |
| | b ග්‍රාමීය නිවාස | 6,599 | 5,000 | |
| | c වතු නිවාස - ලයින් කාමර ඉවත් කිරීම | 1,290 | 500 | |
| **3** | **ගම සමග පිළිසඳර - ග්‍රාමීය සංවර්ධන වැඩසටහන** | | | **85,000** |
| I | සැම ග්‍රාම සේවක වසමකටම රු. මිලියන 03 බැගින් ග්‍රාම සේවා වසම් 14,021 | | 42,063 | |
| II | සැම පළාත් පාලන කොට්ඨාශයකටම රු . මිලියන 04 බැගින් කොට්ඨාශ 4,917 | | 19,668 | |
| III | විමධ්‍යගත අයවැය රු. මිලියන 15 බැගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 | | 3,375 | |
| IV | ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ආයෝජන | | 19,894 | |
| **4** | **Covid 19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක්වූවන්ට සහන සැලසීම** | | | **8,000** |
| I | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින්ට සහන සැලසීම | 400 | 5,000 | |
| II | රට වසාතැබූ කාලය තුළ ආදායම් අහිමි වූ පාසැල් වෑන් රථ හිමියන් සඳහා සහන | | 400 | |
| III | රට වසාතැබූ කාලය තුළ ආදායම් අහිමි වූ ත්‍රීරෝද රථ හිමියන් සඳහා සහන | | 600 | |
| IV | රට වසාතැබූ කාලය තුළ ආදායම් අහිමි පුද්ගලික බස්රථ හිමියන් සඳහා සහන | | 1,500 | |
| V | රට වසාතැබූ කාලය තුළ ආදායම් අහිමි වූ කලාව සහ විනෝදාස්වාදය මත පදනම් වූ වෘත්තීන්හි නියැලෙන්නන්ට සහන සැලසීම | | 500 | |

රු. මිලියන

| | ප්‍රධාන වැඩසටහන | මෙම සංවර්ධන කාර්යයන් සඳහා 2022 ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන | අයවැය යෝජනාව සඳහා යෝජිත ප්‍රතිපාදනය | අංශය සඳහා 2022 ඇස්තමේන්තු ගත මුළු ප්‍රතිපාදනය |
|---|---|---|---|---|
| **5** | **පරිසර හා තිරසර සංවර්ධනය** | | | **5,000** |
| I | පරිසර සංරක්ෂණය | 475 | 2,000 | |
| II | වන රක්ෂණය | 1,875 | 2,000 | |
| III | වන ජීවී | 900 | 1,000 | |
| **6** | **මහජන සේවාවන් හා ග්‍රාමීය යටිතල පහසුකම් සැපයීම** | | | **19,300** |
| I | අධ්‍යාපනය - ජාතික පාසල් 1000 | 2,200 | 5,300 | |
| II | සෞඛ්‍ය /හෙළ වෙදකම දියුණු කිරීම | 32,650 | 5,000 | |
| III | ක්‍රීඩා පහසුකම් සංවර්ධනය | 1,595 | 3,000 | |
| IV | සුළු වාරිමාර්ග | 2,250 | 2,000 | |
| V | වෘත්තීය සහ තාක්ෂණික පුහුණුව | 2,560 | 2,000 | |
| VI | මගී ප්‍රවාහනය (දුම්රිය / ලංගම) | 17,540 | 2,000 | |
| **7** | **මහජන ආරක්ෂාව** | | | **6,700** |
| I | අධිකරණ යටිතල පහසුකම් | 6,937 | 5,000 | |
| II | මහජන ආරක්ෂාව, නීතිය හා සාමය | 7,885 | 500 | |
| III | බන්ධනාගාර රැඳවියන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම | 1,190 | 200 | |
| IV | විශේෂ අවශ්‍යතා සහිත අය හා වැඩිහිටි අය සඳහා පහසුකම් සැපයීම | - | 1,000 | |
| **8** | **ගෘහස්ත ආහාර සුරක්ෂිතතාවය** | | | **31,000** |
| I | ගෘහාශ්‍රිත වෙළඳසැල් (Home Shop) - සෑම ග්‍රාමසේවා වසමකම කාන්තා ව්‍යවසායකයින් සඳහා කුඩා සුපිරි වෙළඳසැල් ජාලයක් ඇති කිරීම (අලෙවි සංවර්ධනය) | - | 15,000 | |
| II | සහන මල්ල - ගෘහ ආහාර සුරක්ෂිතතාව වැඩසටහන | | 15,000 | |
| III | ගැබිනි මාතාවන්ට ලබා දෙන පෝෂණ මල්ල අවුරුදු දෙකක් දක්වා දීර්ඝ කිරීම | 4,000 | 1,000 | |
| **9** | **රාජ්‍ය සේවා** | | | **39,200** |
| I | විභවතා කේන්ද්‍රීය කාර්යක්ෂම රාජ්‍ය සේවාවක් (ඩිජිටල්කරණය) | 3,500 | 500 | |
| II | රාජ්‍ය සේවකයින්ට යතුරුපැදි ලබා දීම | - | 500 | |
| III | ගුරු හා විදුහල්පති වැටුප් විෂමතාවය දුරු කිරීම | 109,000 | 30,000 | |
| IV | උපාධිධාරීන් ස්ථිර කිරීම | 20,000 | 7,600 | |
| V | 2015-2019 කාලය තුළ දේශපාලන පළිගැනීම් වලට ලක්වූවන්ට වන්දි ගෙවීම | | 100 | |
| VI | විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතාව ඉවත් කිරීම | | 500 | |
| **10** | **වෙනත් විශේෂ වෙන්කිරීම්** | | | **900** |
| I | බෞද්ධ විහාර හා සිද්ධස්ථාන වල නඩත්තු කටයුතු | | 500 | |
| II | විවිධ කාල වල අතුරුදහන්වූවන් සඳහා වන්දි ගෙවීම හා හානිපූර්ණය | 965 | 300 | |
| III | වෘත්තියවේදීන්ගේ සංගම් වලට රජයේ දායකත්වය ලබාදීම | | 100 | |
| **මුළු ප්‍රතිපාදනය** | | | **-** | **291,100** |

# ඔබට

# අය වැයෙන්

2 0 2 2